සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

Ministry Of Health and Mass Media

චීන ආධාර යටතේ කොට්ටාව ප්‍රදේශයේ ඉදිකිරීමට යෝජිත සහනාධාර නිවාස ව්‍යාපෘතිය යටතේ දිවයින පුරා ජනමාධ්‍යවේදීන් ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

අරමුණ - ජනමාධ්‍ය වෙනුවෙන් රටට ඉහළ දායකත්වයක් සපයා ඇති ශ්‍රී ලාංකේය ජනමාධ්‍යවේදීන් සඳහා නිවසක් ලබා දීම.

ඉලක්කගත කණ්ඩායම

මේ දක්වා නිවසක් හෝ ඉඩමක් නොමැති, දැනට සේවය කරන ආයතනය තුළ හෝ මාධ්‍ය ක්ෂේත්‍රය තුළ මීට පෙර නිවාස/ඉඩම් සම්බන්ධ කිසිදු ණය මුදලක් හෝ වරප්‍රසාදයක් ලබා නොමැති ජනමාධ්‍යවේදියෙකු වීම.

තෝරා ගැනීමේ නිර්ණායක

- අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය වන විට **වයස අවුරුදු 30 - 60ත්** අතර වයස් කාණ්ඩයේ පසු විය යුතුය.
- ජනමාධ්‍ය ක්ෂේත්‍රය තුළ **අඛණ්ඩව වසර 10ක** සේවා කාලයක් සපුරා තිබීම.
- රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරනු ලබන **2025 හෝ 2026 වසරවල මාධ්‍ය හැඳුනුම්පත** තිබිය යුතුය.
- සියලුම අයදුම්කරුවන් දැනට මාධ්‍ය ක්ෂේත්‍රය හා සම්බන්ධව කටයුතු කරන ආයතනය හරහා ඉල්ලුම්පත් ඉදිරිපත් කළ යුතුය.
- ඉල්ලුම්කරුවන් මාධ්‍ය ක්ෂේත්‍රයට අමතරව වෙනත් ස්ථීර හා රජයේ රැකියාවක නියැලීම හෝ දැනට විශ්‍රාම වැටුපක් ලබා ගැනීම මෙම වරප්‍රසාදය අහිමිවීම සඳහා හේතු වේ.

නිවාස ලබා දීම

- ප්‍රතිලාභ නිවාස ගණන : **27කි.**
- නිවස **නොමිලේ** ලබා දෙන අතර, ඉඩම සඳහා **රුපියල් මිලියන 5.19** ක් නිවස ප්‍රදානයට පෙර ගෙවිය යුතුය.
- මූලික ගෙවීම් සහ වාරික සම්බන්ධයෙන් වන කොන්දේසි ප්‍රවාහන මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය විසින් පනවනු ලැබේ.

අයදුම්පත් යොමු කළ යුතු ආකාරය

www.media.gov.lk වෙබ් අඩවියට සෘජුවම පිවිස එහි ඇති අයදුම්පත සම්පූර්ණ කර හෝ අධ්‍යක්ෂ (මාධ්‍ය), සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය, අංක :163," ඇසිඩිසි මැදුර", කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි "ජනමාධ්‍යවේදීන් සඳහා නිවාස ලබා දීම" යනුවෙන් පැහැදිලිව සඳහන් කළ යුතුය.

අයදුම්පත් බාර ගැනීම 2026.09.18 දිනෙන් අවසන් වේ.

සැලකිය යුතුය:

නිවාසලාභීන් හට එය වෙනත් අයෙකුට පැවරීම විකිණීම හෝ අන් අයට බද්දට හෝ කුලියට දීම සිදු කළ නොහැකි අතර, නාගරික සංවර්ධන අධිකාරිය සමඟ නීතිමය එකඟතාවයකට එළඹීමට සිදු වේ.
මෙම නිවාස ව්‍යාපෘතිය රජය විසින් පනවනු ලබන කොන්දේසිවලට හා ප්‍රවාහන මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය විසින් පනවනු ලබන කොන්දේසි වලට යටත් වේ.

ලේකම්

සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

ජනමාධ්‍යවේදීන් සඳහා චීන ආධාර යටතේ කොට්ටාව ප්‍රදේශයේ ඉදිකිරීමට යෝජිත නිවාස ව්‍යාපෘතියේ නිවාස ලබාගැනීම සඳහා වන අයදුම්පත්‍රය

මෙම අයදුම්පත ඉදිරිපත් කළ හැක්කේ ජනමාධ්‍ය ක්ෂේත්‍රය වෙනුවෙන් රටට ඉහළ දායකත්වයක් සපයා ඇති රජයේ මැදිහත්වීමෙන් නිවසක් ලබා ගැනීමේ දැඩි අවශ්‍යතාවයක් පවතින **වයස 30-60** අතර වයස් කාණ්ඩයේ පසුවන **ශ්‍රී ලාංකික** ජනමාධ්‍යවේදීන් සඳහා පමණි .යම් හෙයකින් නිවසක් ලබාදීම සඳහා තේරී පත්වුවහොත් ඔහුට හෝ ඇයට එය වෙනත් අයෙකුට පැවරීම විකිණීම හෝ අන් අයට බද්දට හෝ කුලියට දීම සිදු කළ නොහැකි අතර, නාගරික සංවර්ධන අධිකාරිය සමඟ නීතිමය එකඟතාවයකට එළඹීමට සිදුවේ. මෙම අයදුම්පත මූලික තොරතුරු ලබා ගැනීම හා කෙටි ලැයිස්තුගත කිරීම සඳහා පමණක් වන අතර, සුදුසුකම් තහවුරු කරගැනීම සඳහා ඉදිරියේදී විවිධාකාරයෙන් තොරතුරුවල නිරවද්‍යතාවය පරීක්ෂාවට ලක් වනු ඇත.

සැ.යු.

1. ඉදිරිපත් කරන සියලුම සහතික හා අනෙකුත් ඇමුණුම්වල සත්‍යතාවය නීතිඥවරයකු හෝ සාමදාන විනිශ්චයකරුවෙකු (මුළු දිවයිනටම) ලවා සහතික කළ යුතුය.
2. තමා සතුව නිවසක් නොමැති බවට මේ සමඟ අමුණා ඇති දිවුරුම් ප්‍රකාශය නීතිඥවරයෙකු හෝ සාමදාන විනිශ්චයකරුවෙකු ලවා සහතික කර ඉදිරිපත් කළ යුතුය.
3. සියලු තොරතුරු අයදුම්කරු විසින්ම සම්පූර්ණ කළ යුතු අතර, අසම්පූර්ණ හෝ දෝෂ සහගත අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප වනු ඇත.

ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය සහ නාගරික සංවර්ධන අධිකාරිය ඒකාබද්ධ ව්‍යාපෘතියකි.

1 කොටස - මූලික තොරතුරු

01. ඉල්ලුම්කරුගේ සම්පූර්ණ නම : .....

.....

02. මාධ්‍ය ක්ෂේත්‍රයේ භාවිතා වන නම : .....

03. ඔබ ශ්‍රී ලාංකිකයෙකු ද? ඔව් ☐ නැත ☐

04. 1.උපන්දිනය :..... 2.ජාතික හැඳුනුම්පත් අංකය.....

05. තමා නියෝජනය කරන මාධ්‍ය ක්ෂේත්‍රය (විද්‍යුත්/ මුද්‍රිත/ වෙබ්) : .....

(2025 හෝ 2026 මාධ්‍ය හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතුය)

06. විවාහක / අවිවාහක බව : .....

07. දුරකථන අංකය (ස්ථාවර) : .....

08. දුරකථන අංකය (වට්ස්ඇප්) : .....

09. ඉහත 05 න් දැක්වෙන රැකියාවේ ස්වභාවය විස්තර කරන්න

.....

.....

.....

.....

10. වාර්ෂික ආදායම : .....

(වැටුප් විස්තරයක් ඉදිරිපත් කළ යුතුයි. එය නොමැති නම් ග්‍රාම නිලධාරී මගින් සනාථ කරන ලද ආදායම් සහතිකයක් ඉදිරිපත් කළ යුතුයි.)

11. පවුලේ සියලුම සාමාජිකයන් පිළිබඳ විස්තර (විවාහක දරුවන් ද ඇතුළත්ව)

	ගෘහ මූලික ඇතුළු සියලුම සාමාජිකයන්ගේ සම්පූර්ණ නම	ස්ත්‍රී පුරුෂ භාවය	උපන්දිනය	වයස	ජාතික හැඳුනුම්පත් අංකය	මාධ්‍යවේදියාට ඇති සම්බන්ධතාවය
01						
02						
03						
04						
05						
06						
07						
08						

12. රැකියාවන්හි නියුතු දරුවන්ගේ තොරතුරු

නම	රැකියාව	රැකියා ස්ථානයේ නම හා ලිපිනය

II කොටස - පදිංචිය සනාථ කිරීම

13. මාධ්‍ය ක්ෂේත්‍රයේ නියුක්තව සිටින කාලසීමාව : .....

14. ලිපිනය: .....

15. ග්‍රාම නිළධාරි වසම : .....

16. තාවකාලික නිවාසය පිහිටි ඉඩමේ අයිතිය : බදු ☐ කුලී ☐ වෙනත් ☐

- බදු හෝ කුලී නිවසක් නම් ගෙවනු ලබන මාසික ගාස්තුව : .....
  (අදාළ ලේඛනවල සහතික කරන ලද පිටපතක් ඉදිරිපත් කළ යුතුයි)

- පදිංචියට පැමිණි වර්ෂය : .....

17. මාධ්‍යවේදියාට හෝ පවුලේ සමාජිකයන්ට රජයේ අනුග්‍රහයෙන් පෙර ලබාගත් නිවසක් හෝ එවැනි වෙනත් දේපල ප්‍රදානයක් පවතී නම් හෝ පැවතියේ නම් ඒ පිළිබඳව විස්තර :

.....
.....
.....
.....

18. මීට පෙර ජනමාධ්‍ය අමාත්‍යාංශය මගින් ප්‍රතිලාභ ලබා තිබේද? .....

19. ලබා තිබේ නම් ඒ පිළිබඳ විස්තර :

.....
.....
.....

20. වර්තමාන පදිංචිය තහවුරු කිරීමට ඉදිරිපත් කළ යුතු ලේඛන :

ලේඛනයේ නම	අමුණා ඇත /නැත
ඉල්ලුම්කරුගේ ජාතික හැඳුනුම්පතේ සහතික කළ පිටපත	
ඉල්ලුම්කරුගේ කලත්‍රයාගේ ජාතික හැඳුනුම්පතේ සහතික කළ පිටපත	
වයස අවුරුදු 18 ට වැඩි අනෙකුත් පවුලේ සාමාජිකයන්ගේ ජාතික හඳුනුම්පත්වල සහතික කළ පිටපත්	
පදිංචිය සනාථ කරනු ලබන ප්‍රාදේශීය ලේකම්ගෙන් තහවුරු කරගත් ග්‍රාම නිලධාරී සහතිකය	
කුලී හෝ බදු නිවසක් නම් ඔප්පුවේ කුලී එකඟතාවේ සහතික කළ පිටපතක් හෝ අදාල ලේඛන	
රජයේ නිළ නිවාසයක පදිංචි නම් එය සනාථ කිරීම සඳහා අදාළ ලේඛන	
ස්ථිර නිවසක් නොමැති බවට දිවුරුම් ප්‍රකාශය	

III කොටස - මාධ්‍ය ක්ෂේත්‍රයේ සඳහා දායකත්වය

21. ජනමාධ්‍යවේදියෙකු ලෙස මාධ්‍ය ක්ෂේත්‍රයේ නිරතවීම වෙනුවෙන් ලබා දී ඇති දායකත්වය/ සේවාව සහ ඒ වෙනුවෙන් ලබාදී ඇති සම්මාන, ගෞරව නාම, සහතික, ඇගයීම් හෝ වෙනත් යම් දෙයක් වේ නම් ඒ පිළිබඳව විස්තර කරන්න.
(කරුණු තහවුරු කිරීමට සහතික කරන ලද ලිඛිත සාක්ෂි ඉදිරිපත් කරන්න)

.....
.....
.....
.....
.....
.....
.....

මා විසින් ඉහතින් සඳහන් කර ඇති සියලු කරුණු සත්‍ය බවට ප්‍රකාශ කරන අතර, එම කරුණු සාවද්‍ය බවට හෙළි වුවහොත් මාධ්‍යකරුවන්ට නිවාස ලබාදීමේ ව්‍යාපෘතිය යටතේ නිවසක් ලබාගැනීමේ හිමිකම මා හට අහිමි වන බවට අවබෝධයෙන් යුතුව පහතින් අත්සන් කරමි.

....

ඉල්ලුම්කරුගේ අත්සන දිනය

ආයතන ප්‍රධානියාගේ නිර්දේශය

..... මහතා/මහත්මිය/මෙනවිය අප ආයතනයේ ස්ථිර / තාවකාලික / ප්‍රාදේශීය/ නිදහස්/වෙබ්/තාක්ෂණික මාධ්‍යවේදියෙකු ලෙස ..... දින සිට .....දින

දක්වා රාජකාරි කටයුතු සිදු කරන බවත්, මේ සඳහා ඉල්ලුම් කිරීමට සුදුසු බවත් නිර්දේශ කරමි. ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවරදි බව සහතික කරමි.

දිනය : ..... අත්සන: .....

නිල මුද්‍රාව:

ග්‍රාම නිලධාරී සහතිකය

ඉහත නම සඳහන් අය .....

දරණ ලිපිනයෙහි ..... සිට මේ දක්වා ස්ථිර/ කුලී/ බදු පදනම මත වසර .....
ක කාලයක් අඛණ්ඩව පදිංචිව සිටින බවට හා ..... වසරේ ඡන්ද හිමි නාමලේඛනයට ඇතුලත්ව සිටින මාධ්‍යවේදියෙකු වන බවත් මෙයින් සහතික කරමි.

දිනය : ..... අත්සන: .....

නිල මුද්‍රාව:

ප්‍රාදේශීය ලේකම් නිර්දේශය

ඉහත පරිදි සං.නි/ සං.සං.ස විසින් සහ ග්‍රාම නිලධාරීන් විසින් මෙම මාධ්‍යවේදියා පිළිබඳ සත්‍ය තොරතුරු සොයා බලා වාර්තා කර ඇත. ඒ අනුව මෙම මාධ්‍යවේදියා වෙත නිවාසයක් ලබාදීම නිර්දේශ කරමි/ නොකරමි.

දිනය :..... .....

ප්‍රාදේශීය ලේකම්

(කරුණාකර නිල මුද්‍රාව තබන්න.)

දිවුරුම් ප්‍රකාශය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ .....

..... (ලිපිනය) නිවසේ පදිංචි .....

.....

..... (සම්පූර්ණ නම) ජාතික හැඳුනුම්පත් අංක ..... වන මම ..... (ජාතිය)..... (ආගම) ආගමිකයෙකු වශයෙන් පහත සඳහන් කරුණු සත්‍ය හා අවංකවත් නිවැරදිව ප්‍රතිඥා දී ප්‍රකාශ කර සිටිමි.

1. ඉහත නම සඳහන් සිද්ධි ප්‍රකාශක මම වෙමි.
2. මා රජයේ මැදිහත්වීමෙන් නිවසක් ලබා ගැනීමේ දැඩි අවශ්‍යතාවයක් පවතින අවුරුදු 30 – 60 අතර වයස් කාණ්ඩයේ පසුවන ශ්‍රී ලාංකිකයෙක් වෙමි.
3. මා හට හෝ මාගේ කලත්‍රයා හට නීත්‍යානුකූලව අයිතිවාසිකම් පවතින ස්ථිර නිවසක් නොමැති බව මෙමගින් ප්‍රකාශ කරමි.

දිවුරුම් ප්‍රකාශකරු

ඉහත කරුණු කියවා බලා තේරුම් ගෙන නිවැරදි බවට,

වර්ෂ 2026.....මස.....දින, මා ඉදිරිපිටදී

ප්‍රතිඥා දී..... දී අත්සන් තබන ලදී.